කො/දේවි බාලිකා විද්‍යාලය

පළමු වාර පරීක්ෂණය - 2014

සිංහල භාෂාව හා සාහිත්‍යය - III

11 ශ්‍රේණිය කාලය පැය 02

- 1 , 2 , 3 , 4 ප්‍රශ්නවලටත් 5 , 6 , 7 ප්‍රශ්න වලින් එකකටත් පිළිතුරු සපයන්න.

01) I සිට X තෙක් ඇති සියලුම අනු කොටස් වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට පිළිතුරු නොලියන්නේ නම් එම අක්ෂර ඉදිරියෙන් ඉරක් අඳින්න.

1. ඒත් මං ඇහිපිය නොගහා ඒ පැත්තම බලාගෙන හිටියේ

   ආ) ඇසිපිය නොගහ බලා සිටියේ කුමක් දෙසද ?

   ආ) ඉහත සඳහන් ප්‍රකාශය ඇතුළත් කතාව අයත් ග්‍රන්ථය ප්‍රකාශයට පත්වූයේ කිනම් වසරේද ?

2. පෙර එක් විසි මසකට නියම කරවා ගත් පිළියම එක්විසි දවසින් ගොඩනගන සිටාණන් හිස්මුල් අටගන්වා පළුද කෙන නො පෙනෙන සේ වණය සුව කළහ.

   ආ) ජීවක සඳහන් කළ පරිදි සිටාණන් විසිඑක් මස ගතකළ යුත්තේ කෙසේද ?

   ආ) අටගන්වා යනු කුමක්ද ?

3. දියෙකින් නැගුණු ගින්නක් මෙන් විය මේ ............ දිනේ

   ඉතකින් කෙසේ වැවෙම් දෝ හිමි ............ සඳිනේ

   ආ) ඉහත කවියේ මුල් පද දෙක සම්පූර්ණ කරන්න.

   ආ) මෙහි ඇති අලංකාර වර්ගය කුමක්ද ?

4. එකෙණෙහි ඒ නිධානය මෝවිටින් නික්ම මහත් වූ ධනරාශියක් සිට ගත.

   ආ) මෙහි සඳහන් උද්ධෘතය ඇතුළත් කතාව එම ග්‍රන්ථයේ කුමන වර්ගයට ඇතුළත් වන්නේද ?

   ආ) මෝවිටින් යනු කුමක්ද ?

5. ඌ යකාට ගියාව දෙන්

   ආ) මෙහි ඌ කවුරුන්ද ?

   ආ) එසේ ප්‍රකාශ කිරීමට හේතුව කුමක්ද ?

6. රිදී කඳකි නයි පැටියෙකු දෙරන ............ වට

   නැරිය දරු සීනේ පෙනුණා ............ බිසවුන්ට

   ආ) මෙම පද්‍ය කොටස ඇතුලත් කෘතියට සමකාලීන කෘති දෙකක නම් ලියන්න.

   ආ) මෙහි සඳහන් ගැමි විශ්වාසය කුමක්ද ?

7. පසේ බුදු කෙනකුන් වහන්සේ නිරොධ සමාපත්තියට සමවැද සත්වන දවස් නිරෝධයෙන් නැගී

අ) මෙහි සඳහන් පසේ බුදුන්වහන්සේ වැඩ සිටියේ කොහේද ?

ආ) බත් බලාගෙන සිටි තැනට පසේ බුදුන්වහන්සේ වැඩිය අයුරු කතාවෙහි උපමා කර ඇත්තේ කෙසේද?

8. අ) සුජේ අක්කා අයත් කතාව කුමණ කෘතියකින් උපුටා ගන්නා ලද්දක්ද ?

ආ) මල්ලිකා වැනි කෙනෙක් නැතැයි කියන්නේ කාටද ?

9. අ) පියසේන ඇසූ ප්‍රශ්නය උපුටා ගන්නා ලද කාව්‍ය සංග්‍රහය කුමක්ද ?

ආ) කිවිඳියගේ වෙනත් කෘති දෙකක නම් ලියන්න.

10. අ) මගුල් ප්‍රස්තාව නාට්‍ය අයත්වන්නේ කුමන සම්ප්‍රදායක්ටද ?

ආ) පියසේන ඇසූ ප්‍රශ්නය රචනා වී ඇති ආකෘතිය කුමක්ද ?

(02) පහත සඳහන් ගද්‍ය පද්‍ය උද්ධෘතයන් ගේ අංකිත පදවල අර්ථය වෙනම ලියා පසුව කොටසේ සම්පූර්ණ අර්ථය ලියන්න.

1. යනාදී සරූප කියා මේ මා ලද පළමු වන සැපත නුඹවහන්සේ මා වැඩී පොසාවනික මිලයට ගෙන වදාල මැනැවැ'යි

2.
ලප සඳ ලෙසින් වෙන් නොවැ ඉඳැ — සමඟවලා
හැමි සඳු කේන සෙවණැලි ලිය — මඩුලුවලා
හිමි සඳු නොදු කලැ එක තැනෙකත් — මේවලා
කෙලෙස ද මසිතු වෑවෙනු කියව — තනිවලා

3. එසේ හෙයින් මාරයාටත් වඩා රජ්ජුරුවන් බිලි බව නො දැනු දැයි මෙසේ වී ගැහනිය භය ගන්වා බිණුව

4.
සුදු සක ලෙසට ඇත් පැටියෙක් විත් — යහනේ
සුදු සොඬ ටිකෙන් මගෙ බඩ පිරිමදිති — අනේ
සුදුයම් දෙයක් සිදුවෙයි මම දුටු — සිනේ
සුදසුන් නිරිඳුනේ මෙතැඳැයි ඔය — සීනේ

• 3 , 4 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. (එක් පිළිතුරකට වචන 125 පමණ සෑහේ)

(03) ජීවක කතාවස්තුව හුදීජනයා අතර බෙහෙවින් ජනප්‍රිය වූයේ,

1) අවස්ථා සිද්ධි නිරූපනයහි

2) චරිත නිරූපණයත්

ඉතා මැනවින් කර තිබීම නිසාය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විස්තර කරන්න.

නැතහොත්

සඳ කිදුරු දා වත සාර්ථක කාව්‍යයක් වූයේ

1) කාව්‍යාලංකාර මැනවින් භාවිතාකිරීමෙත්

2) සහෘදයා අභිමුවේ සජීවී ලෙස ඉන්ද්‍රිය ගෝචර ලෝකය මැවීමත් නිසාය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් යොදාගෙන පැහැදිලි කරන්න.

(04) 1) නිර්මාණ කරුවාගේ පෞද්ගලික අත්දැකීමත් කාව්‍ය අනුභූතිය ලෙස යොදාගැනීමත්,

2) චිත්තරූප මැවෙන ලෙස කාව්‍යෝක්ති යොදාගැනීමත් නිසා වැස්ස පද්‍ය පන්තිය රසිකයන් අතර ජනප්‍රිය වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන මෙම කරුණු සනාථ කර දක්වන්න.

නැතහොත්

පියසේන ඇසූ ප්‍රශ්නය තුලින්

1) දැඩිසේ ඉගෙනීමට ඇලුම් කළ අහිංසක සිතිවිලි ඇති සංවේදී දරුවෙකුගේ අභ්‍යන්තර සිතුවිලි නිර්මාණයවේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් යොදාගෙන ,විස්තර කරන්න.

- 5 , 6 , 7 ප්‍රශ්න වලින් එක් ප්‍රශ්නයකට පිළිතුරු සපයන්න.

(05) ගැමි ජනතාවට හුරුපුරුදු ඔවුනගේ යෙදුම් යොදාගැනීම නිසා යසෝදරාවත පද්‍ය පංතිය කාව්‍යමය ගුණය වැඩි වී ඇත. උදාහරණ තුනක් ගෙන විස්තර කර දක්වන්න.

(06) මගුල් ප්‍රස්තාවේ ගැටුමට තුළින් ප්‍රකට වන්නේ පුද්ගල මනෝභාවයන් වල විවිධත්වයයි. උදාහරණ තුනක් ගෙන පැහැදිලි කරන්න.

(07) "ලඝු කුසලයක වුවද විපාක බලවත් බව" සද්ධර්මරත්නාවලියේ එන බොහෝ කතාවලින් පැහැදිලි වේ. භක්ත භක්තික සිටාණන්ගේ වස්තුව ඇසුරින් පැහැදිලි කර දක්වන්න.

The National e-learning Portal for the General Education

18